මගේ වගාව

TOPGOVIYA FARM MANAGER

ඔබේ වගාවේ **වියදම්, ආදායම හා ලාභය** — එකම තැනක, ඔබේ ෆෝන් එකේම.

භාවිතා කරන හැටි — පියවරෙන් පියවර සරල මාර්ගෝපදේශය

1 **මට මොනවද කරන්න පුළුවන්?** — ඇප් එකේ ඇති පහසුකම් එක බැල්මකින් — පිටුව 2

2 **කොහොමද භාවිතා කරන්නේ?** — පියවර 8ක් — ෆෝන් තිර රූප සමඟ — පිටුව 3

3 **මට ලැබෙන්නේ මොනවද?** — ඔබේ වගාව ගැන ඔබට ලැබෙන ප්‍රයෝජනවත් තොරතුරු — පිටුව 7

✔ සම්පූර්ණයෙන්ම නොමිලේ

✔ ලියාපදිංචි වීමක් නැහැ

✔ ඔබේ දත්ත ඔබේ ෆෝන් එකේ පමණයි

✔ අද දඹුල්ල මිල එක්ක

✔ සිංහල · தமிழ் · English

ෆෝන් කැමරාවෙන් මේ QR එක ස්කෑන් කරන්න

නැත්නම් Chrome එකේ ටයිප් කරන්න:

`topgoviya.lk/mage-wagawa.html`

1 මට මොනවද කරන්න පුළුවන්?

මගේ වගාව — ගොවියෙකුගේ මුදල් පොත, ෆෝන් එකේ

ඔබ ඔබෙන්ම මේ ප්‍රශ්න අසා තිබෙනවාද?

🌱 වගාවට මුළුමනින්ම කොපමණ මුදලක් වැය වුණාද?

💰 බීජ, පොහොර, කෘෂි රසායන හා ශ්‍රමයට කොපමණද?

📊 අස්වැන්නෙන් ලැබුණු ආදායම හා සැබෑ ලාභය හෝ අලාභය කොපමණද?

📈 ඊළඟ කන්නයේදී වඩාත් හොඳ තීරණයක් ගන්නේ කොහොමද?

බොහෝ ගොවීන්ට මේවාට උත්තර ලැබෙන්නේ වගාව **අවසන් වුණාම විතරයි**. **මගේ වගාව** ඒ සියල්ල එක තැනකට ගෙනැල්ලා, වගාව කරන අතරතුරම ඔබේ තත්ත්වය පෙන්වනවා.

💰 වියදම් හා ආදායම

පැළ, පොහොර, රසායන, කම්කරු, ප්‍රවාහනය, කොමිස් — හැම වියදමක්ම. විකුණුම් කාටද, කීයටද, කොපමණද කියලා.

📈 අද දඹුල්ල මිලට ලාභය

ඉතිරි අස්වැන්න අද දඹුල්ල මිලට විකුණුවොත් ලැබෙන ලාභය — දිනපතා යාවත්කාලීන වන මිල එක්ක.

🧮 පාඩු නොවන මිල

වියදම පියවා ගන්න අවශ්‍ය අවම මිල. මුදලාලි දෙන මිල හොඳද නරකද කියලා වහාම තේරෙනවා.

🎯 වගා කරන්න කලින් අයවැය

අවශ්‍ය මුළු මුදල, අපේක්ෂිත ආදායම හා ලාභය. සැලසුම ඉක්මවූ වියදම් රතු පාටින්.

⏰ මතක් කිරීම්

පොහොර, ඉසීම වගේ වැඩ — ඒ වගේම එන්න / දෙන්න තියෙන මුදල්, ගැනුම්කරුවන්ගේ ඉල්ලීම්.

🔔 මිල දැනුම්දීම්

ඔබේ බෝගයේ මිල ගොඩක් ඉහළ හෝ පහළ ගියොත් ප්‍රධාන තිරයේ ඉහළින්ම පෙන්වයි.

📊 වාර්තා (PDF)

ලාභය, මුදල් ගියේ කොහෙද, ඔබේ මිල vs දඹුල්ල මිල, කලින් වගාවට සාපේක්ෂව. WhatsApp එකෙන් පවුලට හෝ බැංකුවට යවන්න.

⏱️ වැඩ පැය

කුලී කම්කරුවන්ගේ වියදම, ඒ වගේම ඔබේ / පවුලේ ශ්‍රමයේ වටිනාකම.

💾 Backup

WhatsApp / Google Drive එකට යවා තියාගන්න. ෆෝන් එක මාරු කළත් දත්ත නැති වෙන්නේ නැහැ.

🔊 හඬින් කියවයි

ලාභය, මිල, වාර්තාව හා උදව් පිටුව ෆෝන් එක කියවනවා — කියවන්න අපහසු අයටත් පහසුයි.

👨‍🌾 **කාටද?** එළවළු, පලතුරු, අල වර්ග, ගම්මිරිස් වගේ ඕනෑම බෝගයක් වගා කරන ගොවීන්ට — අක්කර කාලක සිට ලොකු ගොවිපළ දක්වා. බෝග කිහිපයක් එකවර සටහන් කරන්න පුළුවන්.

2 කොහොමද භාවිතා කරන්නේ?

පියවර 8ක් — මුල් වතාවට මිනිත්තු 5ක් පමණ

1 පියවර 1

ඇප් එක විවෘත කර ෆෝන් එකට ගන්න

ෆෝන් එකේ **Chrome** එකෙන් **topgoviya.lk/mage-wagawa.html** විවෘත කරන්න — නැත්නම් පළමු පිටුවේ QR එක ස්කෑන් කරන්න.

පහළ ඇති **📲 ඇප් එක ගන්න** බබුවොත් **මගේ වගාව** අයිකන් එක ෆෝන් තිරයට එනවා. ඊට පස්සේ ඇප් එකක් වගේම එක තට්ටුවෙන් විවෘත කරන්න.

> 💡 Play Store අවශ්‍ය නැහැ. ලියාපදිංචි වීමක්, මුරපදයක් නැහැ. ඉන්ටර්නෙට් නැතුවත් වැඩ කරනවා.



2 පියවර 2

මුලින්ම උදාහරණය බලන්න

👀 උදාහරණය බලන්න බබන්න. සාම්පල වගා 5ක්, සැබෑ මතක් කිරීම් හා සම්පූර්ණ වාර්තා බලන්න පුළුවන්.

ඔබේ දත්ත වලට කිසිම බලපෑමක් නැහැ. ඉවර වුණාම **✕ උදාහරණයෙන් ඉවත් වන්න** බබන්න.

> 💡 ඇප් එක කරන දේ තේරුම් ගන්න හොඳම ක්‍රමය මෙයයි — ඕනෑම වෙලාවක, කීප වතාවක් වුණත් බලන්න.




3 පියවර 3

ඔබේ වගාව එකතු කරන්න

➕ මගේ පළමු වගාව එකතු කරන්න ඔබා දඹුල්ල ලැයිස්තුවෙන් බෝගය තෝරන්න — ලැයිස්තුවේ නැත්නම් ඔබේම නමක් ලියන්න.

- වගා කළ දිනය හා කන්නය (යල / මහ)
- අක්කර ගණන
- බලාපොරොත්තු අස්වැන්න (උදා: කිලෝ 3000)

> 💡 සියල්ල නොදැනත් පටන් ගන්න පුළුවන් — පසුව ✏️ ඔබා වෙනස් කරන්න.



---


4 පියවර 4

වියදම් හා ආදායම ලියන්න

ප්‍රධාන තිරයේ ලොකු **+ වියදම / ආදායම** බොත්තම ඔබන්න.

- ➖ **වියදමක්:** මුදල හා කෙටි සටහනක් (උදා: "යූරියා කිලෝ 50"). වර්ගය ස්වයංක්‍රීයව තේරෙනවා.
- ➕ **ආදායමක්:** ප්‍රමාණය, මිල හා කාටද විකුණුවේ කියලා.
- ⏱️ **වැඩ පැය:** කුලී කම්කරුවන් හෝ ඔබේ / පවුලේ වැඩ.

> 💡 වියදම කළ දවසේම ලියන්න — බිල්පත් නැති වුණත් මතක තියාගන්න ලේසියි.



5 පියවර 5


ඔබේ වගාවේ තත්ත්වය බලන්න


වගාව ඔබුවොත් මේ දක්වා **ආදායම, වියදම හා ලාභය** එක බැල්මකින් පෙනෙනවා.

පහළ කොළ පාට කොටුවෙන්:

- ඉතිරි අස්වැන්න **අද දඹුල්ල මිලට** විකුණුවොත් ලැබෙන ලාභය
- වියදම පියවා ගන්න අවශ්‍ය **පාඩු නොවන මිල**
- දින 7 / දින 30 සාමාන්‍ය මිල හා මිල ප්‍රවණතාව

💡 මුදලාලි මිලක් කිව්වම මෙතන බලන්න — එම මිල ඔබේ පාඩු නොවන මිලට වඩා වැඩිද?
📅 හැමවිටම **මිලේ දිනය** හා **මිල වර්ගය** (දඹුල්ල තොග මිල) බලන්න.





6 පියවර 6


මතක් කිරීම් දාන්න

ප්‍රධාන තිරයේ ⏰ **මතක් කිරීම්** කාඩ් එකෙන් හෝ වගාව ඇතුළෙන් එකතු කරන්න. වගා වැඩ විතරක් නෙමෙයි:

- "නාරංවිට වත්තේ මඤ්ඤොක්කා වලට පොහොර දාන්න"
- "පල්ලේවල කඩෙන් රු. 10,000ක් එන්න තියෙනවා"
- "රුවන් අයියාගේ ලොරියට තව රු. 20,000ක් දෙන්න"

කාලය ආවම ප්‍රධාන තිරයේ ⏰ **අද / ළඟදී කළ යුතු දේ** යටතේ පෙන්වයි (පරක්කු ඒවා රතු පාටින්).

💡 📅 **Google Calendar** ඔබුවොත් ෆෝන් එකෙන් උදේ මතක් කරයි.




7 පියවර 7

අයවැයක් හදන්න (කැමති නම්)

පහළ මෙනුවේ **🎯 අයවැය** ඔබා එක් එක් වියදමට සීමාවක් ලියන්න.

- 💰 වගාවට අවශ්‍ය මුළු මුදල
- අපේක්ෂිත ආදායම හා අපේක්ෂිත ලාභය
- සැලසුම ඉක්මවූ වියදම් රතු පාටින්

> 💡 ණයක් ගන්න කලින් අයවැය හදාගන්න — කීයක් අවශ්‍යද කියලා පැහැදිලියි.



---


8 පියවර 8

සති දෙකකට වරක් Backup

ඔබේ දත්ත තියෙන්නේ **ඔබේ ෆෝන් එකේ පමණයි**. ඒ නිසා:

- **💾 Backup** → **Backup ගොනුවක් බාගන්න** → WhatsApp / Google Drive එකට යවා තියාගන්න.
- දින 14කින් හෝ අලුත් සටහන් 15කින් පසු ඇප් එක මතක් කරයි.
- අලුත් ෆෝන් එකක: **📂 Backup එකක් ඇතුළත් කරන්න**.

> 💡 හැමවිටම එකම ෆෝන් එකේ, එකම බ්‍රවුසරයෙන් (Chrome) විවෘත කරන්න.



3 මට ලැබෙන්නේ මොනවද?

ඔබ ලියන හැම රුපියලක්ම ප්‍රයෝජනවත් තොරතුරක් වෙනවා

වියදම් හා විකුණුම් ලියන තරමට 📊 **වාර්තාව** ඔබේ ප්‍රශ්න වලට උත්තර දෙනවා. පහත පින්තූර සාම්පල තක්කාලි වගාවකින් (උදාහරණය).

📤 **PDF එකක් ලෙස:** වාර්තාවේ ඉහළ 📤 **WhatsApp එකට යවන්න (PDF)** ඔබා පවුලට, හවුල්කරුට හෝ **ණයක් ඉල්ලන විට බැංකුවට** යවන්න.

❓ මේ වගාවෙන් මට ලාභද?

වියදම, ආදායම හා ලාභය — හා වැදගත්ම කරුණු ගොවියාට තේරෙන භාෂාවෙන්.

වියදම, ආදායම, ලාභය

වියදම		රු. 284,250
ආදායම		රු. 692,500
ලාභය		රු. 408,250

ප්‍රධාන කරුණු


🔊 කියවන්න

- 🌾 👷 **කම්කරු** ඔබේ විශාලතම වියදම: රු. 66,000 (මුළු වියදමෙන් 23%).
- 🌾 මේ දක්වා ලාභය **රු. 408,250**.
- 🌾 ඔබ විකුණූ සාමාන්‍ය මිල රු. 308. එම දිනවල දඹුල්ල සාමාන්‍යය රු. 341 — ඔබට **10% අඩුවෙන්** ලැබුණා.
- 🌾 පාඩු නොවන මිල රු. 95. අද දඹුල්ල මිල රු. 500 – රු. 580.
- 🌾 සැලසුමට වඩා වියදම් වූ වර්ග **2**ක් ඇත.
- 🌾 බලාපොරොත්තු අස්වැන්නෙන් 75% විකුණා ඇත.
- 🌾 ඔබ / පවුල පැය 102ක් වැඩ කළා (වටිනාකම රු. 25,500).

❓ මුදල් වැඩිපුරම ගියේ කොහෙටද?

කම්කරු, පොහොර, රසායන, ප්‍රවාහනය... ඊළඟ වගාවේදී ඉතිරි කරගන්න පුළුවන් තැන් පේනවා.

මුදල් ගියේ කොහෙද



👷 කම්කරු	රු. 66,000 23%
🧪 පොහොර	රු. 49,500 17%
💧 පළිබෝධ / රසායන	රු. 33,400 12%
🌱 බීජ / පැළ	රු. 28,000 10%
🏷️ කොමිස් / ගාස්තු	රු. 26,850 9%
🚚 ප්‍රවාහනය	රු. 25,500 9%
🔧 වෙනත්	රු. 18,000 6%
අනෙක්	රු. 37,000 13%

❓ මට හරි මිලක් ලැබුණාද?

ඔබ විකුණූ හැම දිනකම ඔබේ මිල, එදා **දඹුල්ල මිලට** සාපේක්ෂව. කාටද විකුණුවේ, කීයටද කියලාත්.

විකුණුම් — කාටද, කීයටද

කාටද / කොහෙද	ප්‍රමාණය	සාමාන්‍ය මිල	ආදායම
දඹුල්ල — රත්නායක මුදලාලි	1300 කි.ග්‍රෑ.	248	322,000
කොළඹ — සුනිල් මුදලාලි	500 කි.ග්‍රෑ.	430	215,000
ගමේ කඩය	450 කි.ග්‍රෑ.	346	155,500

මට ලැබුණු මිල vs එදා දඹුල්ල මිල

දිනය	මගේ මිල	දඹුල්ල	වෙනස
2026-09-05	210	230–250	-12%
2026-09-10	270	300–320	-13%
2026-09-20	280	250–350	-7%
2026-10-05	430	450–500	-9%
2026-10-20	440	480–500	-10%

මාසය අනුව: මගේ සාමාන්‍ය මිල vs දඹුල්ල මාසික සාමාන්‍යය

මාසය	මගේ මිල	දඹුල්ල සාමාන්‍යය	වෙනස
සැප් 2026	251	305	-18%
ඔක් 2026	433	466	-7%

❓ කලින් වගාවට වඩා හොඳද?

එකම බෝගයේ කලින් වගාව එක්ක — ඒකකයකට ලාභය, අක්කරයකට ලාභය.


කලින් වගාවට සාපේක්ෂව (මහ, 2025-11)

	මේ වගාව	කලින්
වියදම	284,250	217,000
ආදායම	692,500	488,000
මේ දක්වා ලාභය	408,250	271,000
විකුණූ ප්‍රමාණය	2250 කි.ග්‍රෑ.	2600 කි.ග්‍රෑ.
සාමාන්‍ය මිල	308	188
ඒකකයකට ලාභය	181	104
අක්කරයකට වියදම	568,500	434,000
අක්කරයකට ලාභය	816,500	542,000

❓ මගේ හැම වගාවක්ම එකට?

📊 **වාර්තා → සියලු වගා** — එක් එක් වගාවේ ලාභය හා මුළු ගොවිපළ.

එක් එක් වගාවේ ලාභය



මිල දැනුම්දීම් හා මතක් කිරීම්

ඇප් එක ඔබට කලින්ම කියනවා — වැදගත් දෙයක් මඟහැරෙන්නේ නැහැ


🔔 මිල දැනුම්දීම් පෙන්වන්නේ කවදාද?

ඔබේ වගාවට දඹුල්ල මිල ලැයිස්තුවෙන් බෝගය තෝරා ඇත්නම්, මේ **නීති දෙකෙන් එකක්** ඇති වූ විට 🌾 **මගේ වගා** තිරයේ දැනුම්දීමක් පෙන්වයි:

① මිල ගොඩක් ඉහළ හෝ පහළ ගියොත්
නවතම දඹුල්ල මිල, **දින 30 සාමාන්‍යයට වඩා 20%ක් හෝ ඊට වැඩියෙන්** වෙනස් වූ විට.
🔺 කොළ = මිල ඉහළයි — විකුණීම ගැන සලකා බැලීමට හොඳ අවස්ථාවක් විය හැක.
🔻 රතු = මිල පහළයි.

② අද මිල ඔබේ පාඩු නොවන මිලට වඩා අඩු නම්
පාඩු නොවන මිල (break-even) = (මුළු වියදම − ලැබුණු ආදායම) ÷ ඉතිරි අස්වැන්න. අද දඹුල්ල මිලට විකුණුවොත් **පාඩුයි** කියලා කලින්ම දැනගන්න.

දැනුම්දීම ඔබුවොත් ඒ වගාව විවෘත වෙනවා.



⏰ මතක් කිරීම් — වර්ණ වලින්

ඔබ දැමූ මතක් කිරීම් (පොහොර, ඉසීම, එන්න / දෙන්න තියෙන මුදල්, ගැනුම්කරුවන්ගේ ඉල්ලීම්) **ප්‍රධාන තිරයේ ඉහළින්ම** "අද / ළඟදී කළ යුතු දේ" යටතේ:

- රතු — දවස පහු වෙලා (පරක්කුයි)
- කහ — අද, හෙට හෝ ළඟදීම
- වැඩේ කළ පසු වගාව ඇතුළේ ✔ **කළා** ඔබන්න — ලැයිස්තුවෙන් ඉවත් වෙනවා.

📅 **Google Calendar** එකට දැම්මොත් ඇප් එක වසා තිබුණත් ෆෝන් එක **උදේ 7ට** මතක් කරයි.

💡 දැනුම්දීම් මඟපෙන්වීමක් පමණි — විකුණන්න කලින් ප්‍රවාහනය, කොමිස් හා ගුණාත්මකභාවය සලකා බලන්න. මිල ගණන් මඟපෙන්වීමක් පමණි. ඔබේ තීරණ ඔබේ වගකීම වේ.



✔ සාර්ථකව භාවිතා කරන්න ඉඟි 6ක්

මේ ටික කළොත් ඔබේ වාර්තා ඇත්තටම ප්‍රයෝජනවත් වෙනවා

1. **වියදම කළ දවසේම ලියන්න.** සති අන්තයේ එකවර ලියන්න ගියොත් ගොඩක් දේ අමතක වෙනවා.
2. **හැම විකුණුමක්ම ලියන්න** — කාටද, කීයටද, කොපමණද. ඊළඟ වතාවේ හොඳම මිල දෙන ගැනුම්කරු දැනගන්න.
3. **ඔබේ / පවුලේ වැඩ පැයත් ලියන්න.** ඔබේ ශ්‍රමයේ ඇත්ත වටිනාකම පෙනෙනවා.
4. **සති දෙකකට වරක් Backup** WhatsApp හෝ Google Drive එකට.
5. **හැමවිටම එකම ෆෝන් එකේ, එකම බ්‍රව්සරයෙන් (Chrome)** විවෘත කරන්න — වෙනත් බ්‍රව්සරයක ඔබේ දත්ත පෙන්වන්නේ නැහැ.
6. **ඉහළින් කොළ පාට 🔄 තීරුව ආවොත් ඔබන්න** — ඒ අලුත් සංස්කරණයක්. ඔබේ දත්ත වලට බලපෑමක් නැහැ.

💬 උදව් ඕනද? අදහසක් තියෙනවද?

භාවිතා කරන්න උදව් ඕන නම්, නැත්නම් ඇප් එක දියුණු කරන්න හොඳ අදහසක් තියෙනවා නම් අපට WhatsApp කරන්න:

+94 70 150 0743

🌐 topgoviya.lk/contact.html

ඔබ දෙන එක් අදහසක් වුවත් තවත් ගොවියෙකුට ප්‍රයෝජනවත් නව පහසුකමක් වෙන්න පුළුවන්.

ඇප් එක ඇතුළේ 📖 **උදව්** පිටුවේ පියවරෙන් පියවර උපදෙස් ඇත — 🔊 **කියවන්න** ඔබුවොත් ෆෝන් එක කියවනවා.

🔒 ඔබේ වගා දත්ත ඔබේ ෆෝන් එකේ පමණයි — අපේ සර්වරයකට යවන්නේ නැහැ. · දඹුල්ල මිල: දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, තොග මිල. ලාභ ගණනය ඇස්තමේන්තුවක් පමණි — ප්‍රවාහනය, කොමිස් හා ගුණාත්මකභාවය අනුව සැබෑ මිල වෙනස් වේ. **මිල ගණන් මඟපෙන්වීමක් පමණි. ඔබේ තීරණ ඔබේ වගකීම වේ.**

🚀 **ඉදිරියේදී:** දැනට දඹුල්ල තොග මිල සමඟ ක්‍රියාත්මකයි. ඉදිරියේදී තවත් ආර්ථික මධ්‍යස්ථානවල මිල සමඟ සම්බන්ධ කිරීමට — ඔබේ අස්වැන්නට වඩාත් සුදුසු වෙළෙඳපොළ තෝරාගන්න උදව් වෙන්න — අපි සැලසුම් කරනවා.

අද මිල තොරතුරකි. මිල ප්‍රවණතාව අවස්ථාවකි.
දත්ත මත ගන්නා තීරණය වඩාත් හොඳ හෙටක් සඳහා මඟකි.

🌾 **මගේ වගාව — TopGoviya.lk**

BUILT IN GAMPOLA, SRI LANKA